# සියවසක සිදුවූ ගුවන් ගමන් මතක



ප්‍රථම ගුවන් ගමන තත්පර 12 ක කාලයක් තුළ මීටර් 36.6 ක් දුර ගමන් කළේ ය.

## රයිට් යානය

1903 දෙසැම්බර් 17 වෙනිදා ඇමරිකාවේ උතුරු කැරොලිනාවේ කිටිහෝක් කන්දේ දී ප්‍රථම වරට ඕවිල් රයිට් ගුවන්යානයක් යාන්ත්‍රික බලයෙන් ඉහළ නංවා පාලනය කර ගනිමින් ගුවන් ගමනක් යාමට සමත් විය.

මෙහිදී තටු හැරවීම යානය ඉහළ නැංවීම, චලනය කළ හැකි ප්‍රධාවකය, උමං නළ පරීක්ෂණ, හා කාර්යක්ෂම අවරපත් යොදා ගනිමින් නව නිපැයුම් පෙළක් හඳුන්වාදීමට ඔහු සමත් විය.

## ඩොක්ටර් 1 ට්‍රයිප්ලේන්



1917 අගෝස්තු 30 වෙනිදා පළමුවන ලෝක සංග්‍රමයේදී ඩොක්ටර් 1 යානය පැදවූයේ ජර්මන් නියමුවකු වූ ලෙෆ්ටිනන් වොස් විසිනි. 24 දිනක් තිස්සේ ජයග්‍රහණ 20 ක් ලබා ගැනීමට ඔහු සමත් විය. යුද ගුවන්යානයක් වූ මෙය එතරම් සමබර එකක් නො වුව ද යානය හොඳින් පාලනය කර ගනිමින් සටන් සඳහා යොදා ගෙන ඉතිහාසයට එක්වන්නට ප්‍රවීන නියමුවකු වූ වොස්ට් සමත් විය.

## මෙසර්ෂ්මිට් මී 262



දෙවන ලෝක යුද්ධයේ දී මිතුරු පක්ෂය සඳහා ප්‍රථම වරට එක්වූ මෙම ජෙට් යානය වඩා හොඳ ගුවන්යානා තාක්ෂණයකින් තැනුණු එකක් විය. යුද තුවක්කු 04 ක් සවිකරගත් මේ යානයට පැයට කි. මී. 870 ක වේගයෙන් පියාසර කළ හැකි විය. රජයන් උනන්දු නොවීමත් යාන්ත්‍රික දෝෂ නිසාත් මෙම යානය 1944 වසර තෙක් ගුවන්ගත වීම ප්‍රමාදවීම නිසා යුද්ධයට ලොකු බලපෑමක් කිරීමට එයට හැකියාවක් නොවී ය.

## උතුරු ඇමරිකානු X-15




1959 ත් 1968 ත් අතර ඇමරිකා එක්සත් ජනපදයේ මගින් රැගෙන යන අභ්‍යවකාශ වැඩසටහන් සඳහා සාර්ථකව යොදාගන්නා ලද්දේ මේ ජ-ශ් ව්‍යාපෘතිය යි. අභ්‍යවකාශ වැඩසටහන් සඳහා අවශ්‍ය දත්ත ගුවන් ගතිවිද්‍යාත්මක තොරතුරු පියාසැරි පාලක දත්ත, අධිවේගී ගමන්වලදී ඉහළ මට්ටම්වලදී සිරුරේ ඇතිවන වෙනස්කම් පිළිබඳ දත්ත පර්යේෂණ සඳහා මෙම යානය යොදාගන්නා ලදී.බී 52 බෝම්බ ප්‍රහාරක යානය මගින් මීටර් 13700 ක් ඉහළ අහසේ දී රොකට් ඇන්ජිමක් යොදාගෙන තත්පර 80 ත් 120 ත් අතර උඩුකුරු තෙරපුමක් ලබා දෙමින් මිනිත්තු 10 ක් අහසේ රැඳී සිට පොළවට පහත්වීමට මෙම යානයට හැකියාව තිබිණ. ජ-ශ් යානාවලට සම්ප්‍රදායික පාලක පුවරු යොදාගත්ත ද යානයේ නැහැය හා තටු සඳහා පෘථිවියේ වායුගෝලයෙන් පිටතදී උඩුකුරු තෙරපුමක් ලබාදීම සඳහා රොකට්වලට හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් භාවිත කරනු ලැබී ය. යා හැකි වූ වැඩි ම උස කි. මී. 107.955යි. යා හැකි වැඩි ම වේගය පැයට කි. මී. 7278 (6.7) මෙහි ගුවන්යානා දක්වා ඇත්තේ අනුපාත ප්‍රමාණ වලිනි.

## ලොක්හීඩ් එෆ් 170 නයිට්හෝක්



1988 දී ගුවනට නංවන ලද මෙම බෝම්බ ප්‍රහාරක යානය ලෝකයේ අති නවීන එකක් ලෙස හැඳින්විය හැකි ය. වේගවත් ගමනට උපකාර වන අයුරින් සැකසුණු හැඩතල නිසාත් රේඩාර් කිරණ අවශෝෂණය කර ගත හැකි තීන්ත ආලේප නිසාත් සතුරාට නොපෙනී ඕනෑ ම ඉලක්කයක් කරා පහසුවෙන් ළඟා විය හැක.

## බෝයිං 747

1969 දී ප්‍රථම වරට පියාසර කළ මෙම ලෝක ප්‍රකට මගී යානය ගුවන් ගමනේ විශාල පෙරළියක් ඇති කළේ ය. ජම්බෝ ජෙට් යනුවෙන් හඳුන්වන මෙය ලොවපුරා ගුවන් ගමන් සමාගම් තම සේවා සඳහා යොදාගන්නා අ... මගීන් සංඛ්‍යාවක් ගෙන යා හැකි එහි වි... යානය බෝයිං 747 - 400 ලෙස් හැඳින් වේ. මෙම යානයෙහි වරකට මගීන් 567 කට ගමන් කළ හැක.

## මැක්ඩොනල්ඩ් ඩග්ලස් AH- 64 ඇපචි



නිරවි යුද්ධයේ දී සෝවියට් දේශයේ ප්‍රධාන යුද ටැංකිවලට මුහුණ-දීම සඳහා ඇමරිකා එක්සත් ජනපදය සකස් කළ විශේෂ ගුවන්යා-නය 'ඇපචි' නම් හෙලිකොප්ටරය යි. එය අති විනාශකාරී ප්‍රහාර එල්ල කළ හැකි අති නවීන යානයකි. මෙහි අලුත් ම වර්ගයේ යානයකට රේඩාර් කුලුණක් යොදා ගෙන යානය තුළ ඇති මිසයිල එකවර වෙනස් ඉලක්ක ගණනාවකට සැගවී සිට යැවීමට හැකියාව ඇත.

1903 ඇමරිකාවේ රයිට් යානය ගුවන්ගත වීම

1910 ජර්මනියේ සෙෆලින් යානයෙන් මගී සේවාවක් ඇරඹීම.

1919 ඇමරිකාවේ පියාසර යාත්‍රාවක් අත්ලාන්තික් සාගරය හරහා යාම

1927 ඇමරිකාවේ ලින්බර්ග් අත්ලාන්තික් හරහා තනිවම පියාසර කිරීම

1937 ඇමරිකාවේ හිනඩන්බර්ග් ගුවන් අනතුර

1947 ඇමරිකාවේ චක් ඊගර් ශබ්දයේ වේගය ඉක්මවීම

1949 ... ගුවනේ ... නොනවත් ... ඇමරිකාවේ ලකී ලේඩි ii දී ඉන්ධන පුරවා ගනිමින් ලොව වටා යාම

1967 ප්‍රංශයේ කොංකෝඩ් යානය ලොව ප්‍රථම සුපර්සොනික් යානයේ ගුවන් ගමන

1977 කැනේරි දූපත් බෝයිං 747 යානය ධාවන පථය තුළදී 583 ක් ඝාතනය කරමින් ලොව දරුණු ම ගුවන්යානා අනතුර සිදු කළේ ය.




1907 ප්‍රංශයේ ප්‍රථම හෙලිකොප්ටර් ගමන

1917 බ්‍රිතාන්‍යයේ, ජර්මන් ගුවන්යානා ලන්ඩනයට පහරදීම

1924 ඇමරිකාවේ ඩග්ලස් ගුවන්යානා දෙකක් ලොව වටා කළ ගමන

1930 බ්‍රිතාන්‍යයේ ඇමී ජොන්සන් ඕස්ට්‍රේලියාව තෙක් තනි ගමනක යෙදීම

1942 රුසියාව සිකෝස්කි ප්‍රථම වරට ප්‍රායෝගික හෙලිකොප්ටරය නිපදවීම

1948 බර්ලිනයේ ගුවන ප්‍රවාහනය

1951 ඇමරිකානු නාවික හමුදාව ප්‍රවාහනය සඳහා ප්‍රථම වරට හෙලිකොප්ටර් යොදා ගැනීම

1970 – බ්‍රිතාන්‍යය ප්‍රථම බෝයිං 744 වානිජ ගුවන් ගමන සඳහා හීත්රෝ ගුවන් තොටුපලින් නික්ම යාම

1986 – ඇමරිකාවේ වයේජර් ගුවන්යානය ඉන්ධන නැවත පිරවීමක් නොමැතිව ලොව වටා සාර්ථක ගමනක යෙදීම

1999 – ස්විට්සර්ලන්තය බ්‍රේට්ලින් ඕබිටර් 3 නම් බැලූනය ප්‍රථම වරට ලොව වටා පියාසර කිරීම

රොයිටර් පුවත් සේවයේ අනුග්‍රහයෙනි